පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - විද්‍යාව

සතිය - සැප්තැම්බර් III

ශ්‍රේණිය - 10

සැකසුම - W.G.D. වත්තෙගෙදර මයා , කෑ /දෙහි/මුහන්දිරම් ක.වි.

Department of Education,Sabaragamuwa Province/ Weekly School

## පදාර්ථයේ වෙනස්වීම්

1) ඔබට නිවසේදී පහසුවෙන් සිදුකළ හැකි පහත ක්‍රියාකාරකම්වල නිරත වී ඒවාට අදාළ නිරීක්ෂණ ලියන්න.

| | ක්‍රියාකාරකම | නිරීක්ෂණ |
|---|---|---|
| I | අයිස් කැටයක් දීසියක් මත තබා (කාමර උෂ්ණත්වය යටතේ) ටික වේලාවකින් නිරීක්ෂණය කරන්න. | |
| II | කඩදාසි කැබැල්ලක් දහනය කරන්න. | |
| III | කපුරු බෝලයක් ලෝහමය හැන්දක් මත තබා ඉටිපන්දම් දැල්ලෙන් රත් කරන්න (මෙය මුව ආවරණ පැළඳ ප්‍රවේශමෙන් සිදු කරන්න). | |
| IV | ඉටිපන්දමක් දල්වා තබා ටික වේලාවකින් නිරීක්ෂණය කරන්න. | |
| V | බිත්තර කටු කැබලි කිහිපයක් වීදුරුවකට දමා එයට විනාකිරි මිශ්‍ර කර නිරීක්ෂණය කරන්න. | |

ඔබේ විද්‍යාව පෙලපොතේ දෙවන කොටසේ 88වන පිටුවේ සිට 94වන පිටුව දක්වා අධ්‍යයනය කර පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

2) i) “භෞතික විපර්යාස” ලෙස හැඳින්වෙන්නේ මොනවාද ?

ii) “රසායනික විපර්යාස” ලෙස හැඳින්වෙන්නේ මොනවාද ?

iii) ඉහත ඔබ සිදුකළ එක් එක් ක්‍රියාකරකමේදී සිදු වන්නේ භෞතික විපර්යාසයක් ද රසායනික විපර්යාසයක් ද යන වග සඳහන් කරන්න.

3) රසායනික විපර්යාසයක් සිදු වී ඇති බවට හඳුනාගත හැකි නිරීක්ෂණ 5ක් ලියන්න.

4) රසායනික විපර්යාස ආකාර 4ක් ඇත. ඒවා මොනවාද ?

5) ඉහතදී ඔබ සඳහන් කළ එක් එක් රසායනික ප්‍රතික්‍රියා වර්ගයට අදාළ වන තුලිත රසායනික සමීකරණ 3 බැගින් ලියන්න .

6) විද්‍යාව පෙළපොතේ පිටු අංක 94හි 16.1 පැවරුම කරන්න.